## රුහුණු විශ්වවිද්‍යාලය - 2013

රුහුණු විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය සහ 111 වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙත 2014 ජුනි 05 දින නිකුත් කරන ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අදාල බව හා ගුණාත්මක බව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (IRQUE) මඟින් 2004 සිට 2010 දක්වා වූ කාලපරිච්ඡේදය තුලදී මිලට ගෙන විශ්වවිද්‍යාලය වෙත පවරන ලද රු.මිලියන 162.95 ක වත්කම් සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කිරීමේදී සාධාරණ අගය නොසලකා පිරිවැය මත ගිණුම්ගත කර තිබුණි.

(ආ) පුස්තකාල පොත් මිලදී ගැනීම හා අත්තිකාරම් පියවීම් නියමිත පරිදි ගිණුම්ගත නොකිරීම හේතුවෙන් පුස්තකාල පොත් ගිණුම රු. 458,867 කින් අඩුවෙන් හා අත්තිකාරම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) වර්ෂය තුල මිලදී ගෙන තිබූ රු. 17,338,186 ක් වටිනා පර්යේෂණ යාත්‍රාව ප්‍රාග්ධන ගතකිරීම වෙනුවට අත්තිකාරම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මෝටර් රථ වාහන ශේෂය තුල වූ වාහන 21 ක සාධාරණ අගය ගිණුම්වල දක්වා නොතිබූ අතර එම වාහන 21 හි මුළු වටිනාකම දක්වා තිබුනේ රු. 110,963 ක් වශයෙනි.

(ඉ) වැඩ අවසන් කර විශ්වවිද්‍යාලයට භාරදී ප්‍රයෝජනයට ගනු ලබන රු.79,274,956 ක ගොඩනැගිලි පුනරුත්ථාපන ව්‍යාපෘති 35 ක අගය හා රු.26,555,749 ක නව ඉදිකිරීම් ව්‍යාපෘතියක අගය ගොඩනැගිලි ගිණුමට මාරු නොකිරීම හේතුවෙන් මෙම වටිනාකම් මත වාර්ෂික ක්ෂය ගැලපීම්ද සිදුකර නොතිබුණි.

(ඊ) සිසුන් විසින් ලබා නොගත් රු.834,900 ක් වූ ශිෂ්‍යාධාර හා මහපොල ශිෂ්‍යත්ව මුදල් වර්ෂය අවසානයේ වගකීමක් ලෙස දක්වනවා වෙනුවට අදාල වියදම්වලින් අඩුකර දක්වා තිබුණි. එසේම ලබානොගත් මහපොල ගිණුමට හර කළයුතු රු.285,950 ක් ලබානොගත් ශිෂ්‍යාධාර ගිණුමට හරකර තිබුණි.

(උ) කෘෂි පීඨයට අදාල 2011 වර්ෂයේ සිට පැවැති රු. 486,094 ක ශේෂයක් 2012 මූල්‍ය ප්‍රකාශනවල හා උපලේඛනවල දක්වා නොතිබූ නමුත් 2013 වර්ෂයේදී ශේෂයක් ලෙස පෙන්වීම තුලින් ගිණුම්වල තුල්‍යතාවය පිළිබඳව ප්‍රශ්නකාරී විය.

**2.2.2 නොසැසඳූ පාලන ගිණුම්**

ගිණුම් විෂයයන් 09 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව දැක්වෙන ශේෂ හා උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂ අතර රු. 9,233,263 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ගිණුම් විෂයය | ගිණුම අනුව ශේෂය | උපයෝගී ලේඛන අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| පුස්තකාල පොත් හා වාර සඟරා අත්තිකාරම් | 2,817,217 | 11,674,391 | 8,857,174 |
| අවසාන තොගය - ඉංජිනේරු පීඨය | 671,164 | 650,495 | 20,669 |
| - වෛද්‍ය පීඨය | 1,971,285 | 1,962,548 | 8,737 |
| - කෘෂි පීඨය | 904,822 | 899,389 | 5,433 |
| පර්යේෂණ අත්තිකාරම් | 55,189 | 44,960 | 10,229 |
| ගමන් වියදම් අත්තිකාරම් | 1,607,689 | 1,607,699 | 10 |
| පර්යේෂණ වියදම් අත්තිකාරම් | 177,358 | 190,000 | 12,642 |
| ජාත්‍යන්තර පර්යේෂණ අත්තිකාරම් | 638,680 | 397,443 | 241,237 |
| මහජන බැංකු තීරු ගිණුම | 22,472,899 | 22,550,031 | 77,132 |
| | | | 9,233,263 |

**2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පාරිතෝෂික මුදල් හා සේවක අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමට ප්‍රථම විශ්වවිද්‍යාලයට අය විය යුතු සේවක ණය අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා සේවකයන් 07 දෙනෙකුගෙන් එකතුව රු. 377,575 ක ණය ශේෂයන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. එසේම මේ සඳහා වගකිව යුතු නිළධාරීන්ගෙන් අදාල මුදල් පොලී සහිතව අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 ජනවාරි සිට 2011 අප්‍රේල් දක්වා වූ කාල පරිච්ඡේදය තුල ගෙවන ලද ජීවන වියදම් දීමනාව මත සේවක අර්ථසාධක හා සේවක භාර අරමුදල් ගණනය කර නොතිබුණු අතර එම කාලය තුල විශ්‍රාම ගිය හා සේවයෙන් ඉවත් වූ පුද්ගලයින් සඳහා ජීවන වියදම් දීමනාව මත සේවායෝජකයා ගෙවිය යුතු සේවක අර්ථසාධක හා භාර අරමුදල් දායක මුදල් ලෙස 2012 වර්ෂයේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබී තිබුණු රු. 3,622,864 ක මුදලින් රු. 1,463,480 ක් අදාල පුද්ගලයින් වෙත නොගෙවා විවිධ තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. මෙම මුදල් කඩිනමින් අදාල පුද්ගලයන් වෙත ගෙවීමට හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත නැවත යැවීමට හෝ ක්‍රියාකර නොතිබුණි.

(ඇ) විවිධ විදේශ මිලට ගැනීම් වෙනුවෙන් 1990 සිට 2012 දක්වා ලංකා බැංකුව හා මහජන බැංකුව මගින් ගෙවන ලද පිළිවෙලින් රු.811,535 ක හා රු.1,793,300 ක අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි. මීට අදාල භාණ්ඩ ලැබී ඇත්නම් විධිමත් පරිදි අත්තිකාරම් පියවීමට හෝ භාණ්ඩ ලැබී නොමැති නම් වගකිව යුතු පාර්ශවයන්ගෙන් මෙම මුදල් අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂ තුල මහපොල හා ශිෂ්‍යාධාර ගෙවීම සඳහා බැංකු වෙත ලබා දුන් මුදලින් සිසුන් විසින් මුදල් ලබා නොගැනීම හේතුවෙන් ඉතිරි වූ රු. 6,531,050 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට නොගෙවූ මහපොල හා ශිෂ්‍යාධාර ගිණුම් වල ඉතිරිව පැවතුණි. එම මුදල් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පුස්තකාල පොත් හා වාර සඟරා මිලට ගැනීම වෙනුවෙන් 2006 සිට 2012 දක්වා ගෙවන ලද රු. 3,199,601 ක අත්තිකාරම් මුදලක් 2014 ජූලි දක්වා පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

1982 වර්ෂයේ සිට ගිණුම්වල පෙන්වන රු. 150,000 ක ස්ථාවර තැන්පතුවට අදාල ස්ථාවර තැන්පතු සහතිකය හෝ ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය.

**2.3 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , රෙගුලාසි යනාදියට යොමුව | | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | (i) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වගන්තිය | වැටුප් සමඟ ගෙවන දීමනාවලට අමතරව ගෙවනු ලබන අනිකුත් දීමනා හා ගාස්තු වෙනුවෙන් උපයන විට ගෙවීමේ බදු අය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී බදු අයකිරීමෙන් තොරව රු. 12,516,081 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. |
| | (ii) | 2011 අංක 22 දරන පනතින් සංශෝධිත 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 117 (ඒ) වගන්තිය | 2013 වර්ෂය තුල බාහිර දේශක ගාස්තු වශයෙන් ගෙවන ලද රු. 24,238,524 කින් උපයන විට ගෙවීම් බදු අඩුකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | (i) | xix පරිච්ඡේදයේ 5 වගන්තිය | විශ්වවිද්‍යාලය සතු නිල නිවාස වල පදිංචි අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් මෙම වගන්තිය ප්‍රකාරව නිවාස කුලී අයකර ගෙන නොතිබුණි. |
| | (ii) | xxiv පරිච්ඡේදයේ 3.18 හා 3.18(i) වගන්ති | වැටුප් රහිත නිවාඩු අනුමත කිරීමට ප්‍රථම ණය මුදල් අයකර ගැනීමටත් එසේ නොවන්නේනම් ණය වාරික හා පොළී මුදල මාසිකව ලැබීම සඳහා වැඩ පිළිවෙලක් සකස්කර ගත යුතු වුවත්, එසේ කටයුතු නොකර වැටුප් රහිත නිවාඩු අනුමත කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 104 | 2013 අප්‍රේල් 02 දින හදිසි අනතුරකට ලක්වූ වාහනයක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | මුදල් රෙගුලාසි 387 | 2013 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ජංගම ගිණුම් දෙකකට අදාලව රු. 1,158,514 ක මුදලක් අයිරා පොලී ලෙස ගෙවා තිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | මුදල් රෙගුලාසි 1646 | වාහන වල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය සතු වාහන 23 ක 2013 වර්ෂයට අදාල ධාවන සටහන් නියමිත පරිදි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය සතු ස්ථාවර වත්කම් වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොතිබුණි. |
| (ඉ) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු වාහන රක්ෂණය කිරීමේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හෝ ජාතික රක්ෂණභාර අරමුදල මගින් සෘජුව රක්ෂණය කළ යුතු වුවත් එයට පටහැනිව වාහනයක රක්ෂණය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ අලෙවි නියෝජිතයකු හරහා සිදු කර තිබුණි. |
| (ඊ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2.11 ඡේදය | මාස 06 කට වරක් වාහනවල ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් කළ යුතු වුවත් විශ්වවිද්‍යාලය සතු වාහන 49 කින් වාහන 18 ක ඉන්ධන දහනය පරීක්ෂා කිරීම 2014 ජූලි 30 දක්වා සිදුකර නොතිබුණි. |
| (උ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ | |

| | | |
|---|---|---|
| (i) | 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛය | ගිවිසුම් කඩ කරන ලද ආචාර්යවරුන්ගෙන් අය කර ගනු ලබන මුදල්, ස්ථිර තැන්පතු/භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කළ යුතු වුවද එයට පටහැනිව අයකර ගෙන තිබුණු රු.30,237,101 ක විශ්වවිද්‍යාලය ප්‍රයෝජනයට ගෙන තිබුණි. |
| (ii) | 2006 ජුනි 06 දිනැති අංක 876 දරන චක්‍රලේඛය | පරිගණක යෙදවුම් සහකාර iii තනතුරට 17 දෙනෙකු බඳවා ගැනීමේ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන විධිමත් ක්‍රමවේදයක් සකස් කර ඊට පාලක සභාවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඌනතාවය රු.164,624,000 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම ඌනතාවය රු.150,391,000 ක් වී තිබුණි. මේ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 14,233,000 කින් පිරිහී තිබුණි. ක්‍රියාකාරී වියදම් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි.

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු

කරන ලද නඩුවක්ද විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ හා කම්කරු විනිශ්චය සභාවේ ගොනුකරන ලද නඩු 17 ක් ද පැවතුණි.

**4 මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

විද්‍යා පීඨයෙහි හා ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයෙහි අවම කාලය තුල උපාධිය සම්පූර්ණ නොකිරීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 25 ක් හා සියයට 30 ක් පමණ විය. එනම් සමස්ථ විභාග අපේක්ෂකයින්ගෙන් 1/4 කට ආසන්න ප්‍රමාණයක් අවම කාලය තුල උපාධිය සම්පූර්ණ කර නොතිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ හා මූල්‍ය පීඨය සඳහා අර්ධ ස්ථිර ගොඩනැගිලි දෙකක් ඉදිකිරීමට 2013 අප්‍රේල් 26 දින පුද්ගලික කොන්ත්‍රාත්කරුවෙකුට රු. 14,000,000 කට ඉදිකිරීම් කටයුතු පවරා තිබූ අතර එය සාර්ථකව නිම කර 2014 මාර්තු 11 දින වන විගණන අවස්ථාව දක්වාම භාරදී නොතිබුණි. එසේම මෙම ඉදිකිරීමට අදාල ඇස්තමේන්තු සැකසීමේදී ලබාගත් මිනුම් විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර මෙහි වූ රු.3,656,184 ක ඉතිරිකිරීම් උපයෝගී කර ගනිමින් මුල් ඇස්තමේන්තුවට ඇතුළත් නොකළ රු. 2,757,124 ක අතිරේක වැඩ කොටස් කොන්ත්‍රාත්කරුගේ මිල ගණන් මත ඉටුකර ගැනීම හේතුවෙන් ලැබිය හැකිව තිබූ තරඟකාරී වාසිය විශ්වවිද්‍යාලයට අහිමි වී තිබුණි.තවද විදුලි සවිකිරීම වෙනුවෙන් විස්තරාත්මක වැඩ ඇස්තමේන්තුවකින් තොරව රු. 1,500,000 ක් වෙන් කර තිබුණු අතර මිල ගණන් අනුමැතියක් රහිතව කොන්ත්‍රාත්කරුට රු. 1,080,000 ක් ගෙවා තිබුණි.

(ආ) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන්ගෙන් අයවිය යුතු ලෙස විශ්වවිද්‍යාලය හඳුනා ගෙන තිබුණු මුළු මුදල රු. 55,421,498 ක් වූ අතර මින් රු. 30,237,101 ක් 2013 දෙසැම්බර් 31 දිනට අයකර ගෙන තිබුණි. එදිනට තවදුරටත් හිඟ මුදල රු. 25,184,397 ක් වූ අතර මෙය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. මින් එකතුව රු. 19,189,451 ක් වූ ණය ශේෂ 24 ක් වර්ෂ 5 කට වඩා පැරණි ණය ශේෂ විය. මෙය අයවිය යුතු මුදලින් සියයට 76 කි.

1994, 2012 හා 2013 යන වර්ෂවල සේවය අතහැර ගිය ආචාර්යවරුන් තිදෙනෙකුගෙන් අයවිය යුතු මුදල ගණනය කිරීම 2014 මැයි වනවිටත් සිදුකර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැල්ලමඩම පරිශ්‍රයේ සිසුන් සඳහා නේවාසිකාගාර කුලියට ගැනීම.

පරීක්ෂාවට භාජනය වූ පිරිමි නේවාසිකාගාර වල සිසුන් 274 කට හා පඹුරණ කාන්තා නේවාසිකාගාරයේ කාන්තා සිසුන් 25 කට නේවාසික පහසුකම් සැපයීමේ හැකියාව තිබියදී රු. 600,000 ක් ගෙවා නේවාසිකාගාර දෙකක් 2013 මැයි 15 සිට වර්ෂයක කාලයකට කුලියට ගෙන තිබුණි. සියළු අළුත්වැඩියා හා නඩත්තු කටයුතු නිවාස අයිතිකරු විසින් ඉටුකළ යුතුය යන කොන්දේසිය මත රජයේ තක්සේරුකරු විසින් එක් නේවාසිකාගාරයක මාසික කුළිය රු. 25,000 ක් ලෙස නියම කර තිබුණද එම කොන්දේසිය ගිවිසුමට ඇතුළත් නොකර නේවාසිකාගාරය කුළියට ගෙන තිබුණි. එක් නේවාසිකාගාරයක අළුත්වැඩියා හා නඩත්තු වියදම් ලෙස විශ්වවිද්‍යාලය විසින්

2014 පෙබරවාරි 07 දින දක්වා රු. 77,198 ක් වැයකර තිබුණි. එසේම මෙම නේවාසිකාගාරය සිසුන් සඳහා නේවාසික පහසුකම් ලබා දීමට සුදුසු තත්ත්වයක නොතිබුණි. අනෙක් නේවාසිකාගාරය රජයේ තක්සේරුකරුගේ කුළී තක්සේරුවකින් තොරව රු. 25,000 ක මාසික කුළියකට ලබාගෙන 2013 ඔක්තෝබර් දක්වා නිෂ්ක්‍රීයව පැවැතීම හේතුවෙන් එම කාලය වෙනුවෙන් ගෙවන ලද රු. 112,500 ක කුළිය නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ආ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වාහනයක් 2009 ජුනි 11 දින විශ්වවිද්‍යාලයට රැගෙනවිත් තිබූ අතර එදින සිට විගණිත දිනය වූ 2014 මැයි 22 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව විශ්වවිද්‍යාල භූමියේ දිරාපත් වෙමින් පැවතුණි. මෙම වාහනයට අදාල ලියාපදිංචි පොත හා ආදායම් බලපත්‍රය විගණිත දින දක්වා විශ්වවිද්‍යාලය වෙත ලැබී නොතිබුණි.

(ඇ) විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් තොරව හා පවතින විකල්ප පිළිබඳව අධ්‍යයනයකින් තොරව රු. 17,338,186 ක් වැය කර ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා පර්යේෂණ යාත්‍රාවක් නිපදවාගෙන තිබුණි. මෙම යාත්‍රාව 2013 මාර්තු 08 දින විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇතත් 2014 මැයි 20 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ශ්‍රී ලංකා නාවික හමුදාවට අයත් ගාල්ල නාවික කඳවුර තුල නැංගුරම්ලා තිබුණි. එහෙත් පීඨයේ පර්යේෂණ කටයුතු සඳහා 2008 සිට 2013 දක්වා යාත්‍රා කුලියට ගැනීම සඳහා වසරකට රු. 30,000 ක් පමණක් වැයකර තිබූ බව අනාවරණය විය.

## 4.4 දෘශ්‍ය අක්‍රමිකතා

-----------------

මුල්‍ය හා වත්කම් කළමනාකරණ දුර්වලතා හේතුවෙන් පහත දැක්වෙන අක්‍රමිකතාවයන් අනාවරණය විය.

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ න්‍යෂ්ටික විද්‍යා අධ්‍යයනාංශය මගින් සිදු කරනු ලබන වෛද්‍ය පරීක්ෂණ වෙනුවෙන් 2011 ජනවාරි 01 සිට 2013 ඔක්තෝබර් 15 දක්වා අය කරන ලද රු. 189,000 ක් වෙනුවෙන් ලැබීම් කුවිතාන්සි නිකුත් නොකර මුදල් වංචා කර තිබුණි.

(ආ) වෛද්‍ය පීඨයේ ක්වේට් පිරිමි නේවාසිකාගාරයේ වටිනාකම රු. 47,077 ක් වූ ගෑස් සිලින්ඩර් 12 ක, ලිප් දෙකේ ගෑස් උදුනක හා ගෑස් රෙගුයුලේටර් 04 ක ඌනතාවයක් නිරීක්ෂණය විය.

## 4.5 අරමුදල් ඌන උපයෝජනය.

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පර්යේෂණ ප්‍රදාන මත ක්‍රියාත්මක වන ව්‍යාපෘති 18 ක් සඳහා ලැබුණු රු. 2,188,808 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල භාවිතයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) ක්‍රියාත්මක නොවන ව්‍යාපෘති(කෘෂි /වෛද්‍ය/විද්‍යා) ගිණුම් 03 ක එකතුව රු. 1,150,485 ක් වර්ෂ කිහිපයක සිට නිෂ්ක්‍රීයව පැවැති අතර එම මුදල් ආධාර ලබා දුන් පාර්ශවයන් වෙත යැවීමට හෝ විශ්වවිද්‍යාල ආදායමට ගැනීමට හෝ ක්‍රියාකර නොතිබුණි.

(ඇ) 2011 හා 2012 වර්ෂවලදී විවිධ ව්‍යාපෘති වෙනුවෙන් ලැබුණු රු. 2,814,484 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා විවිධ තැන්පත් ගිණුමේ පැවතුණි. එම මුදල් අපේක්ෂිත අරමුණට යොදාගැනිමට හෝ ලබාදුන් පාර්ශවයන් වෙත යැවීමට හෝ ආදායමට ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨයේ විවිධ ව්‍යාපෘති 09 ක් සඳහා පර්යේෂණ ප්‍රදාන යටතේ ලැබී තිබුණු රු.1,826,604 ක් වර්ෂ 1 සිට වර්ෂ 4 දක්වා කාල පරිච්ඡේදයක් තුල නිෂ්ක්‍රීයව පැවතුණි.

**4.6 හඳුනා ගන්නා ලද පාඩු**

විශ්වවිද්‍යාලයේ වැල්ලමඩම සංකීර්ණයේ විවිධ අධ්‍යයනාංශ සඳහා වටිනාකම රු. 2,620,140 ක් වූ සර්වර් (Server) 06 ක් මිලදී ගැනීමට 2011 දෙසැම්බර් 13 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම අනුව සති 08 ක් තුළ අදාල භාණ්ඩ සැපයිය යුතු වුවත් ඒ සඳහා වූ ප්‍රමාදය වෙනුවෙන් අයවිය යුතු ප්‍රමාද ගාස්තු රු.262,017 ක් අය නොකර සම්පූර්ණ මුදල සැපයුම්කරු වෙත ගෙවා තිබුණි.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු.**

විධිමත් පිරිවැය ඇස්තමේන්තුවකින් තොරව 2013 දෙසැම්බර් 31 දින රු. 1,456,000 ක් ගෙවා කොන්ක්‍රීට් කාණු ආවරණ කැබලි 1000 ක් මිලට ගෙන තිබුණු අතර මෙම කාර්ය සඳහා පළමු වර සීමිත මිල ගණන් කැඳවීම අනුව වර්ෂ 05 ක වගකීම් කාලයක් සහිතව එක් කොන්ක්‍රීට් ආවරණයක් රු. 1,428 කට (එකතු කළ අගය මත බදු මුදල් සහිතව) සැපයීමට එකඟ වී එක් සැපයුම්කරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මේ සඳහා දෙවන වර මිල ගණන් කැඳවීම් කර තිබූ අතර වගකීම් කාලය විමසා නොතිබුණි. සපයන ලද කාණු ආවරණ සඳහා වැරගැන්වීම් යෙදීමේ නිවැරදිතාවය සහ කොන්ක්‍රීට්වල ශක්තිය පිළිබඳ රසායනාගාර වාර්තාවක් රහිතව මෙම මිලට ගැනීම සිදුකර තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 154 ක්ද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 101 ක්ද පැවැතුණි.

**4.9 සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම**

සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 356,357,000 ක් වූ අතර මේ වෙනුවෙන් අරමුදල් ආයෝජනයක් සිදු කර නොතිබුණි.

**5 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක PFR/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි .

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී සංයුක්ත සැලැස්ම කෙරෙහි අවධානය යොමුකර ඒ අනුව අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවත් එසේ අවධානය යොමුකර තිබූ බව නිරීක්ෂණය නොවුණි. තවද පිළියෙල කර ඇති සංයුක්ත සැලැස්මේ ඇතැම් මූල්‍යමය දත්ත ඇතුළත්කර නොතිබීම නිසා අයවැය ලේඛනය සංයුක්ත සැලැස්ම සමඟ සැසඳීමට නොහැකි විය. 2013 වර්ෂයේ දී ආදායම් හා වියදම් ඇස්තමේන්තු කිරීමේ දී ඇතැම් ආදායම් හා වියදම් තාර්කික පදනමකින් තොරව ඇස්තමේන්තුකර තිබුණි.

**5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2011 සහ 2012 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම 2014 මැයි 01 දින දක්වා සිදු කර නොතිබුණි.

**5.4 නොවිසඳී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ**

විශ්වවිද්‍යාලය සතු නිල නිවාස වල පදිංචි වී සිටින නිළධාරීන්ගෙන් නිවාස කුලිය අය කිරීම පිළිබඳ 2009 දෙසැම්බර් 03 දින සිට අවස්ථා 09 කදී විගණන විමසුම් මගින් පාලනාධිකාරීයේ අවධානය යොමුකර ඇති අතර 2012 ඔක්තෝබර් 04 දින පවත්වන ලද අංක 73 දරන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී ද මේ පිළිබඳ සාකච්ඡා කර තීරණයකට එළඹ තිබුණි. නමුත් මෙම තීරණය ක්‍රියාත්මක කිරීම 2014 මැයි 22 දින දක්වා සිදුකර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වාහන පාලනය
(ඇ) නිල නිවාස කුලී අයකිරීම
(ඈ) අත්තිකාරම් පියවීම
(ඉ) ගිවිසුම් කඩ කළ ආචාර්ය වරුන්ගෙන්/සේවකයන්ගෙන් මුදල් අයකර ගැනීම
(ඊ) ඉන්වෙන්ට්‍රි පාලනය